# ගෙවුම් තුලනය

පසුගිය වසරේ ක්‍රියාකාරිත්වය හා සසඳන කළ, වෙළෙඳාම, සේවා සහ ජංගම ගිණුම් විග්‍රහයට අනුව, 1986 දී ගෙවුම් තුලනයෙහි සුළු වර්ධනයක් පෙන්නුම් කෙරිණි. කෙසේ වුවද, වර්ෂය තුළදී සමස්ථ ශේෂය තවදුරටත් හිඟයක් වශයෙන්ම, විගැහි දශ ලක්ෂ 74 ක් විය. 1985 දී විගැහි දශ ලක්ෂ 711 ක්ව පැවති වෙළෙඳ ගිණුමේ හිඟය 1986 දී විගැහි දශ ලක්ෂ 644 දක්වා අඩු වූ අතර 1985 දී විගැහි දශ ලක්ෂ 133 ක්ව පැවති සේවා ගිණුමේ හිඟය, මෙම දෙවසර අතරතුරදී විගැහි දශ ලක්ෂ 115 දක්වා අඩුවිය. එම උපනතියම අනුගමනය කරමින්, 1985 දී විගැහි දශ ලක්ෂ 410 ක්ව පැවති ජංගම ගිණුමේ හිඟය, 1986 දී විගැහි දශ ලක්ෂ 357 දක්වා අඩු වූ අතර, එම හිඟය හා දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතය සියයට 6.9 සිට සියයට 6.5 දක්වා පහත වැටුණි. නිළ සංක්‍රාම ඉවත් කළ පසු, 1985 දී විගැහි දශ ලක්ෂ 582 ක් වූ ජංගම ගිණුමේ හිඟය, 1986 දී මඳක් අඩු වී විගැහි දශ ලක්ෂ 509 ක් වූ අතර, එම හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතයක් වශයෙන් ගත්විට 1985 දී සියයට 9.9 සිට 1986 දී සියයට 9.3 දක්වා පහත වැටිණ.


1985 දී වාර්තා වූ සියයට 9.2 ක පහළ යාමකින් පසු, අපනයන ආදයම, ප්‍රධාන වශයෙන් වෙළෙඳ ද්‍රව්‍යවල මිළ ගණන් අඩුවීම හේතුකොට ගෙන 1986 දී සියයට 21 ක් තරම් වැඩි ප්‍රමාණයකින් පහත වැටිණි. තේ, රබර්, පොල් සහ ඛණිජ තෙල් නිෂ්පාදිතයන්හි මිළ අඩු වීම හේතුවෙන් සමස්ථ අපනයන මිළ දර්ශකය, විගැහි අනුව, සියයට 25.7 කින් පහත වැටුණි. තේ මිළ සියයට 38.4 කින් අඩු වූ අතර, රබර් සහ පොල් මිළ පිළිවෙලින් සියයට 7.7 කින් සහ සියයට 55.6 කින් පහත වැටුණි. ජාත්‍යන්තර වෙළෙඳපොලේ බොර තෙල් මිළෙහි තියුණු පහත වැටීම නිසා 1986 දී ඛණිජ තෙල් නිෂ්පාදිත මිළ සියයට 46.9 කින් අඩු විය. අනෙක් අතට, රබර් හැර අනෙකුත් මූලික වෙළෙඳ ද්‍රව්‍යවල අපනයන පරිමාව, පසුගිය වසර හා සසඳන කළ 1986 දී ඉහළ නැඟුණි. වටිනාකම අනුව බලන විට, කෘෂිකාර්මික අපනයන සියයට 30.4 කින් අඩු වූ අතර, ඛණිජ තෙල් නිෂ්පාදිත අත්හල පසු කාර්මික අපනයන සියයට 10.6 කින් වැඩි විය. 1986 දී, කාර්මික අපනයන අතුරින් රෙදිපිළි සහ මසා නිමකළ ඇඳුම්, වැඩිම විදේශ විනිමය ප්‍රමාණයක් ඉපැයූ (දළ ඉපැයීම් පදනමක් මත) එකම අංශය බවට පත්වීම සැළකිය යුතු කරුණකි.

අපනයන ඉපැයීම්හි උපනතියම අනුගමනය කෙරෙමින් 1986 වර්ෂයේ ආනයන ගෙවීම්හිද සියයට 16.6 ක අඩු වීමක් වාර්තා කෙරිණි. මෙම අඩු වීමට විශාල වශයෙන් හේතුවූයේ ආනයන මිළ ගණන් පහළ යාමයි. වර්ෂය තුළදී සමස්ථ ආනයන මිළ දර්ශකය, විගැහි වටිනාකම අනුව, සියයට 20.9 කින් පහත වැටුණි. 1986 දී මූලික ආනයන කාණ්ඩයන්ගේ මිළ පහත වැටිණ. සහල්, සීනි සහ තිරිඟු පිටි යන මූලික ආහාර ද්‍රව්‍යවල ආනයන මිළ ගණන් පිළිවෙලින් සියයට 25.3, 9.9 සහ 25.8 කින් පහත වැටුණි. අන්තර් භාණ්ඩ ආනයන අතුරින් 1986 දී බොර තෙල් සහ පොහොර මිළ ගණන්හි පිළිවෙලින් සියයට 52.7 ක සහ සියයට 21.9 ක සැළකිය යුතු පහත වැටීම් වාර්තා විය. වටිනාකම අනුව බලන කළ, පාරිභෝගික භාණ්ඩ ආනයන සියයට 6.3 කින්ද, අන්තර් භාණ්ඩ ආනයන සියයට 19.7 කින්ද පහත වැටිණි. කෙසේ වුවද, 1986 වසරේ අහස්යානා සහ නැව් ආනයන ඉවත් කළවිට ආයෝජන භාණ්ඩ ආනයනයන්හි සුළු වැඩි වීමක් පෙන්නුම් කෙරිණි.

1986 දී බොහෝ ආනයන භාණ්ඩයන්හි මිළ ගණන් අඩුවුවද, ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි සමස්ථ මිළ ගණන්වල වෙනස්වීම් ශ්‍රී ලංකාවට අවාසිදායක විය. මේ හේතුවෙන් වෙළෙඳ අනුපාතය වර්ෂය තුළදී සියයට 5.0 කින් පිරිහිණි. 1985 දී සියයට 19.8 ක පහත වැටීම මත සිදුවූ මෙම පිරිහීම ජාත්‍යන්තර වෙළෙඳාමේ අහේතුක වෙනස්වීම්වලට ශ්‍රී ලංකා ආර්ථිකය පහසුවෙන් ගොදුරු වීමේ ස්වභාවය නැවත විදහා දක්වයි.

# ගෙවුම් තුලනය

වාර්ෂිකව




ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 34 සංඛ්‍යා සටහන

## 1982 — 1986 ගෙවුම තුලනය – විශ්ලේෂණාත්මක ඉදිරිපත් කිරීම

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1986(ආ) | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1986(ආ) |
| 1. වෙළෙඳ භාණ්ඩ .. | – 20,403 | – 20,168 | – 11,850 | – 19,801 | – 21,017 | – 890 | – 801 | – 453 | – 711 | – 644 |
| අපනයන .. | 21,098 | 25,038 | 37,198 | 35,728 | 33,881 | 918 | 993 | 1,427 | 1,296 | 1,029 |
| ආනයන .. | 41,501 | 45,206 | 49,048 | 55,529 | 54,898 | 1,808 | 1,794 | 1,880 | 2,007 | 1,673 |
| 2. සේවා .. | – 314 | – 1,411 | – 1,735 | – 3,647 | – 3,683 | – 13 | – 56 | – 66 | – 133 | – 115 |
| ලැබීම් .. | 6,962 | 8,033 | 8,567 | 8,926 | 10,594 | 304 | 320 | 329 | 323 | 322 |
| ගෙවීම් .. | 7,276 | 9,444 | 10,302 | 12,573 | 14,277 | 317 | 376 | 395 | 456 | 437 |
| 3. භාණ්ඩ හා සේවා (1+2) .. | – 20,717 | – 21,579 | – 13,585 | – 23,448 | – 24,700 | – 903 | – 857 | – 519 | – 844 | – 759 |
| 4. සංක්‍රාම (ශුද්ධ) .. | + 8,873 | +10,457 | +12,185 | +12,040 | +13,239 | + 387 | + 416 | + 468 | + 434 | + 402 |
| පෞද්ගලික (ශුද්ධ) .. | 5,494 | 6,441 | 7,031 | 7,212 | 8,251 | 240 | 256 | 270 | 262 | 250 |
| නිල (ශුද්ධ) .. | 3,379 | 4,016 | 5,154 | 4,828 | 4,988 | 147 | 160 | 198 | 172 | 152 |
| 5. ජංගම ගිණුම් ශේෂය (3+4) .. | – 11,844 | – 11,122 | – 1,400 | – 11,408 | – 11,461 | – 516 | – 441 | – 51 | – 410 | – 357 |
| 6. මූල්‍ය නොවන ප්‍රාග්ධනය .. | +10,954 | +10,616 | + 8,755 | + 9,062 | + 9,898 | + 477 | + 420 | + 335 | + 328 | + 302 |
| පෞද්ගලික අංශය .. | 5,517 | 4,005 | 62 | 1,646 | 1,837 | 240 | 160 | 2 | 58 | 55 |
| රාජ්‍ය අංශය .. | 5,437 | 6,611 | 8,693 | 7,416 | 8,061 | 237 | 260 | 333 | 270 | 247 |
| දිගුකාලීන (ශුද්ධ) .. | 5,437 | 6,613 | 8,693 | 7,416 | 8,061 | 237 | 260 | 333 | 270 | 247 |
| ලැබීම් .. | (6,954) | (8,546) | (10,387) | (9,422) | (11,314) | (304) | (337) | (398) | (342) | (346) |
| ගෙවීම් .. | (1,517) | (1,933) | (1,694) | (2,006) | (3,253) | (67) | (77) | (65) | (72) | (99) |
| කෙටිකාලීන (ශුද්ධ) .. | — | 2 | — | — | — | — | — | — | — | — |
| 7. රුපියල් අගය පිළිබඳ ගැලපිලි .. | – 124 | + 82 | – 39 | + 1,491 | + 1,371 | — | — | — | — | — |
| 8. වැරදීම් හා අත්හැරීම් .. | + 5 | + 766 | – 254 | – 205 | – 1,931 | + 21 | + 21·6 | + 13 | – 29 | – 19 |
| 9. විගැහි වෙන්කිරීම් .. | — | — | — | — | — | — | — | — | — | — |
| 10. සමස්ථ ශේෂය .. | – 1,009 | + 342 | + 7,062 | – 1,060 | – 2,124 | – 18 | 0·6 | + 297 | – 111 | – 74 |
| 11. මූල්‍ය වෙනස්වීම් ( – අතිරික්තය) .. | + 1,009 | – 342 | – 7,062 | + 1,060 | + 2,124 | + 18 | – 0·6 | – 297 | + 111 | + 74 |
| ශ්‍රී ලංකා රුපියල්/විගැහි (විනිමය අනුපාතිකය සාමාන්‍යය) | | | | | | 22·98 | 25·16 | 26·08 | 27·63 | 32·90 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ ) සංශෝධිත.
(ආ) තාවකාලික.
සටහන : මූල්‍ය අංශයේ සියළු ගණුදෙනු කාලච්ඡේදය අවසානයේ අනුපාතිකය අනුව පරිවර්තනය කොට ඇත.

1986 දී සේවා ගිණුම පසුගිය වසරට වඩා අඩු හිඟයක් පෙන්නුම් කළේය. 1985 දී වාර්තා කෙරුණු රුපියල් දශ ලක්ෂ 3,647 (විගැහි දශ ලක්ෂ 133) හා සැසඳීමේ දී 1986 දී සේවා ගිණුමේ හිඟය රුපියල් දශ ලක්ෂ 3,683 (විගැහි දශ ලක්ෂ 115) ක් විය. පොළී ගෙවීම්, රජයේ වියදම් සහ විවිධ සේවා වෙනුවෙන් වූ ශුද්ධ වියදම් පහත වැටීම, සේවා ගිණුමේ හිඟය අඩු වීමට හේතු විය.

ගෙවීමට ඇති ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ හැර ගැනීම් ඇතුළත්ව විදේශීය ණය සඳහා වූ පොළී ගෙවීම්, 1985 දී රුපියල් දශ ලක්ෂ 5,404 (විගැහි දශ ලක්ෂ 196) ක පොළී ගෙවීම් හා සසඳන කල 1986 දී රුපියල් දශ ලක්ෂ 5,336 (විගැහි දශ ලක්ෂ 162) ක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විගැහි මත වූ පොළී අනුපාතයන් අඩු කිරීමත් සහ ජාත්‍යන්තර පොළී අනුපාතයන්හි පහළයාම, විදේශීය ණය සඳහා වූ පොළී වගකීම් අඩුකිරීමෙහිලා උපකාරී විය. එයට අමතරව, ගෙවීමට ඇති වෙළෙඳ ණය ප්‍රමාණය 1985 දී විගැහි දශ ලක්ෂ 834 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 766 දක්වා අඩු වීමද, පොළී බර ප්‍රමාණය තරමක් දුරට සැහැල්ලු කරලීමට සමත් විය. කෙසේ වුවද, පොළී ගෙවීම් තවදුරටත් සේවා ගිණුමේ එකම විශාලතම අයිතමය වශයෙන් පැවතිණ. මෙය, මෑත වර්ෂවලදී ගෙවුම් තුලන මූල්‍යකරණය සඳහා වෙළෙඳ ණය වැඩියෙන් උපයෝගි කර ගැනීමේ සහ ඇතැම් රාජ්‍ය ආයතනයන්ගේ විශාල වෙළෙඳ ණය ගැනීම්වල නොවැළැක්විය හැකි ප්‍රතිඵලය විය. එයාර් ලංකා සමාගම මගින් පමණක් ගෙවන ලද පොළී ප්‍රමාණය, 1986 දී මුළු පොළී ගෙවීම්වලින් සියයට 11 ක් විය.

පොළී ලැබීම්, එනම් ප්‍රධාන වශයෙන් මහ බැංකුවේ විදේශීය ආයෝජනවලින් ලත් ආදායම, වෙළෙඳ බැංකු, මහ කොළඹ ආර්ථික කොමිසම සහ අනෙකුත් අනුමත ව්‍යවසායයන්හි විදේශ තැන්පතුවල පොළී ඉපැයීම් කලින් වසර තුළදී රුපියල් දශ ලක්ෂ 2,256 (විගැහි දශ ලක්ෂ 82) ක් වූ අතර මේ වසරේදී රුපියල් දශ ලක්ෂ 1,899 (විගැහි දශ ලක්ෂ 58) ක් විය.

1985 දී රජයේ සේවා සහ අනෙකුත් විවිධ සේවා සඳහා ශුද්ධ විදේශ විනිමය ගෙවීම්, පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 152 (විගැහි දශ ලක්ෂ 6) සහ රුපියල් දශ ලක්ෂ 871 (විගැහි දශ ලක්ෂ 32) ක් වූ අතර, 1986 දී එය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 110 (විගැහි දශ ලක්ෂ 3.3) සහ රුපියල් දශ ලක්ෂ 347 (විගැහි දශ ලක්ෂ 13) ක් වී යයි ඇස්තමේන්තු කර ඇත. කලින් වසර හා සැසඳීමේදී, වරාය, ප්‍රවාහනය සහ රක්ෂණය මගින් ගෙවුම් තුලනය මත වූ අහිතකර බලපෑමේ අඩුවීමක් 1986 දී දක්නට ලැබුණි.

සංචාරක කටයුතු සඳහා අවාසිදායක වාතාවරණයක් සහිත පසුබිමක් තුළින් 1986 දී සංචාරක කර්මාන්තයෙන් ලත් දළ ඉපැයීම්, විගැහි වටිනාකම අනුව, පසුගිය වසරේදී පැවති මට්ටමට වඩා සියයට 13.3 කින් අඩු විය. 1985 දී සංචාරක ව්‍යාපාරයෙන් ලත් විගැහි දශ ලක්ෂ 81 ක් වූ දළ ආදායම 1986 දී විගැහි දශ ලක්ෂ 70 ක් වීයයි ඇස්තමේන්තු කර ඇත. එයින් ලත් ශුද්ධ විදේශ විනිමය ඉපැයීම් ඉකුත් වසරේදී විගැහි දශ ලක්ෂ 35 ක් වූ අතර, 1986 දී එය විගැහි දශ ලක්ෂ 23 ක් ලෙස ඇස්තමේන්තු කර ඇත. 1986 දී සංචාරක පැමිණීම් සියයට 10.6 කින් පහත වැටුණි. සංචාරකයෙකුගේ සාමාන්‍ය වියදම 1985 දී විගැහි 315 සිට 1986 දී විගැහි 306 දක්වා සුළු වශයෙන් පහත වැටිණ.

සේවා ගිණුමේ වූ ධනාත්මක ප්‍රතිඵලය, 1981 වනතුරු ගෙවුම් තුලනය මත වූ පීඩනය ලිහිල් කිරීමට උපකාරී වුවද, ඉන් පසුව දිගටම පැවතුණ හිඟයන් ජංගම ගිණුමේ හිඟය තවදුරටත් පුළුල් කිරීමට හේතු විය. 1985 දී ජංගම ගිණුමේ හිඟයෙන් සියයට 32 ක්ව පැවති සේවා ගිණුමේ ශුද්ධ ගෙවීම් ප්‍රමාණය 1986 දී ද එම මට්ටමෙහිම පැවතිණ.

## 1 . 35 සංඛ්‍යා සටහන

## සේවා සහ සංක්‍රාම 1985 – 1986

රුපියල් දශ ලක්ෂ (වරහන් තුල විගැහි දශ ලක්ෂ)

| ශීර්ෂය | බැර | | | හර | | | ශේෂය | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1985(අ) | 1986(ආ) | වෙනස 1985/86 | 1985(අ) | 1986(ආ) | වෙනස 1985/86 | 1985(අ) | 1986(ආ) |
| වරාය, ප්‍රවාහනය සහ රක්ෂණ .. | 2,016 | 2,758 | + 742 | 2,170 | 2,874 | + 704 | – 154 | – 116 |
| | (73) | (84) | (+11) | (78) | (88) | (+10) | (– 5) | (– 4) |
| සංචාර .. | 2,233 | 2,300 | + 67 | 1,258 | 1,549 | + 291 | + 976 | + 751 |
| | (81) | (70) | (– 11) | (46) | (47) | (+1) | (+35) | (+23) |
| ආයෝජන ආදායම් .. | 2,261 | 1,907 | – 354 | 5,706 | 5,768 | + 62 | – 3,445 | – 3,861 |
| | (82) | (58) | (– 24) | (207) | (176) | (– 32) | (– 125) | (– 118) |
| (1) ලාභ සහ ලාභාංශ | 5 | 8 | + 3 | 302 | 432 | + 130 | – 297 | – 424 |
| | (—) | (—) | (—) | (11) | (14) | (+3) | (– 11) | (– 14) |
| (2) පොළී .. | 2,256 | 1,899 | – 357 | 5,404 | 5,336 | – 68 | – 3,148 | – 3,437 |
| | (82) | (58) | (– 24) | (196) | (162) | (– 34) | (– 114) | (– 104) |
| රජයේ වියදම් .. | 310 | 389 | + 79 | 462 | 499 | + 37 | – 152 | – 110 |
| | (11) | (12) | (+1) | (17) | (15) | (– 2) | (– 6) | (– 3) |
| විවිධ සේවා .. | 2,106 | 3,240 | +1,134 | 2,977 | 3,587 | + 610 | – 871 | – 347 |
| | (76) | (99) | (+23) | (108) | (112) | (+4) | (– 32) | (– 13) |
| මුළු සේවා .. | 8,926 | 10,594 | +1,668 | 12,573 | 14,277 | +1,704 | – 3,647 | – 3,683 |
| | (323) | (323) | (—) | (456) | (438) | (– 18) | (– 133) | (– 115) |
| පෞද්ගලික සංක්‍රාම .. | 7,920 | 9,142 | +1,222 | 708 | 891 | + 183 | +7,212 | +8,251 |
| | (288) | (277) | (– 11) | (26) | (27) | (+1) | (+262) | (+250) |
| නිල සංක්‍රාම .. | 4,828 | 4,988 | + 160 | — | — | — | +4,828 | +4,988 |
| | (172) | (152) | (– 20) | (—) | (—) | (—) | (+172) | (+152) |
| මුළු සංක්‍රාම .. | 12,748 | 14,130 | +1,382 | 708 | 891 | + 183 | +12,040 | +13,239 |
| | (460) | (429) | (– 31) | (26) | (27) | (+1) | (+434) | (+402) |
| මුළු සේවා සහ සංක්‍රාම .. | 21,674 | 24,724 | +3,050 | 13,281 | 15,168 | +1,887 | +8,393 | +9,556 |
| | (783) | (752) | (– 31) | (482) | (465) | (– 17) | (+301) | (+287) |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

1986 දී පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලැබීම් රුපියල් වටිනාකම අනුව සියයට 15.4 කින් වැඩි වුවද, විගැහි වටිනාකම අනුව සියයට 3.8 ක අඩු වීමක් වාර්තා කෙරිණි. 1985 දී වූ, රුපියල් දශ ලක්ෂ 7,920 (විගැහි දශ ලක්ෂ 288) ක්වූ දළ පෞද්ගලික සංක්‍රාම, 1986 දී රුපියල් දශ ලක්ෂ 9,142 (විගැහි දශ ලක්ෂ 277) ක් විය. යෝජනා ක්‍රම ආධාර සහ ද්‍රව්‍යාධාර වලින් සමන්විත නිල සංක්‍රාම, විගැහි වටිනාකම අනුව, 1985 දී රුපියල් දශ ලක්ෂ 4,828 (විගැහි දශ ලක්ෂ 172) සිට 1986 වනවිට රුපියල් දශ ලක්ෂ 4,988 (විගැහි දශ ලක්ෂ 152) දක්වා තියුණු ලෙස අඩු වීමක් ඇස්තමේන්තු කර ඇත. 1985 දී රුපියල් දශ ලක්ෂ 12,040 (විගැහි දශ ලක්ෂ 434) ක් වූ පෞද්ගලික හා නිල සංක්‍රාමවලින් ලත් මුළු ශුද්ධ ආදයම, විගැහි වටිනාකම අනුව, සියයට 7.4 ක අඩු වීමක් පෙන්නුම් කරමින් 1986 දී රුපියල් දශ ලක්ෂ 13,239 (විගැහි දශ ලක්ෂ 402) ක් විය.

1986 දී පෞද්ගලික හා නිල සංක්‍රාමවලින් ලත් ශුද්ධ විදේශීය ආදයම, භාණ්ඩ හා සේවා ගිණුමේ හිඟයෙන් සියයට 53 ක් පියැවීමට ප්‍රමාණවත් විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් ජංගම ගිණුමේ රුපියල් දශ ලක්ෂ 11,461 ක (විගැහි දශ ලක්ෂ 357) ක හිඟයක් වූ අතර, මූල්‍ය නොවන ප්‍රාග්ධන ලැබීම් තුළින් සහ විදේශීය වත්කම් පහත දැමීමක් මගින් එය පියැවිණි. ජංගම ගිණුමේ හිඟයෙන් සියයට 85 ක් පියැවීමට, මූල්‍ය නොවන මුළු ශුද්ධ විදේශීය ලැබීම් සමත් වූ අතර, ඉතිරි වූ රුපියල් දශ ලක්ෂ 2,124 (විගැහි දශ ලක්ෂ 74) ක සමස්ථ හිඟය පියැවීම සඳහා විදේශීය වත්කම් උපයෝගී කර ගැනීමට සිදුවිය.

1982 සිටම අඩු වෙමින් පැවති මූල්‍ය නොවන ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් 1986 දී තවදුරටත් සියයට 7.9 කින් අඩු විය. සෘජු ආයෝජන, දිගුකාලීන විදේශීය ණය සහ කෙටිකාලීන ණය ඇතුළු පෞද්ගලික අංශයේ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 1,646 (විගැහි දශ ලක්ෂ 58) ක් වූ අතර 1986 දී රුපියල් දශ ලක්ෂ 1,837 (විගැහි දශ ලක්ෂ 55) ක් විය. යෝජනා ක්‍රම සහ භාණ්ඩ ණය වශයෙන් වූ රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම් පසුගිය වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 7,416 (විගැහි දශ ලක්ෂ 270) හා සසඳන කල 1986 දී රුපියල් දශ ලක්ෂ 8,061 (විගැහි දශ ලක්ෂ 247) ක් විය. මෙය රාජ්‍ය අංශයේ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම්වල සියයට 8.5 ක පහත වැටීමක් පෙන්නුම් කරයි.

## 1 . 36 සංඛ්‍යා සටහන
## 1984 – 1986 විදේශ සම්පත් පරතරය පියවීම


| වර්ගය | රුපියල් දශ ලක්ෂ | | | විගැහි දශ ලක්ෂ | | |
|---|---|---|---|---|---|---|
| | 1984(අ) | 1985(අ) | 1986(ආ) | 1984(අ) | 1985(අ) | 1986(ආ) |
| **1. විදේශීය ලැබීම්** .. | **53,418** | **52,574** | **53,617** | **2,050** | **1,907** | **1,629** |
| 1.1 අපනයන .. | 37,198 | 35,728 | 33,881 | 1,427 | 1,296 | 1,029 |
| 1.2 සේවා .. | 8,567 | 8,926 | 10,594 | 329 | 323 | 323 |
| 1.3 පෞද්ගලික සංක්‍රාම .. | 7,653 | 7,920 | 9,142 | 294 | 288 | 277 |
| **2. විදේශීය ගෙවීම්** .. | **77,427** | **82,313** | **84,977** | **2,969** | **2,980** | **2,597** |
| 2.1 ආනයන .. | 49,048 | 55,529 | 54,898 | 1,880 | 2,007 | 1,672 |
| 2.2 සේවා .. | 10,302 | 12,573 | 14,277 | 395 | 456 | 438 |
| 2.3 පෞද්ගලික සංක්‍රාම .. | 622 | 708 | 891 | 24 | 26 | 27 |
| 2.4 ප්‍රාග්ධන ආපසු ගෙවීම් .. | 17,455 | 13,503 | 14,911 | 670 | 491 | 460 |
| **3. විදේශ සම්පත් පරතරය** .. | **–24,009** | **–29,739** | **–31,360** | **– 919** | **– 1,073** | **– 968** |
| **4. සම්පත් පරතරය පියවීම** .. | **+24,009** | **+27,739** | **+31,360** | **+ 919** | **+ 1,073** | **+ 968** |
| **4.1 ණය ප්‍රමාණය කෙරෙහි බලනොපාන ගණුදෙනු තුලින් පියවීම** .. | **6,096** | **5,543** | **5,817** | **234** | **198** | **178** |
| 4.1.1 නිල ප්‍රදාන .. | 5,154 | 4,828 | 4,988 | 198 | 172 | 152 |
| 4.1.2 සෘජු ආයෝජන .. | 942 | 715 | 829 | 36 | 26 | 26 |
| 4.1.3 විගැහි වෙන්කිරීම .. | — | — | — | — | — | — |
| **4.2 ණය ලබාගැනීම් සහ සංචිත උපයෝගී කරගැනීම්** .. | **18,206** | **22,911** | **26,103** | **672** | **904** | **809** |
| 4.2.1 දිගුකාලීන ණය .. | 9,410 | 8,834 | 9,915 | 361 | 320 | 304 |
| 4.2.2 කෙටි කාලීන ණය .. | 11,086 | 9,055 | 8,018 | 424 | 327 | 245 |
| 4.2.3 සැපයුම්කරුවන්ගේ ණය සහ අනිකුත් දිගුකාලීන ණය | 977 | 588 | 1,399 | 37 | 22 | 42 |
| 4.2.4 වාණිජ ණය ගැනීම් (පෞද්ගලික අංශය) .. | 1,075 | 2,407 | 2,722 | 42 | 88 | 83 |
| 4.2.5 බැංකු ණය ගැනීම් .. | — | 3 | — | — | — | — |
| 4.2.6 ද්විපාර්ශ්වික ශේෂ .. | — | — | — | — | — | — |
| 4.2.7 ජා. මූ. අ. කළ ගැණුම .. | 1,288 | 237 | 1,614 | 31 | — | — |
| 4.2.8 වෙනත් .. | 285 | 1,213 | 1,220 | 13 | 23 | 16 |
| 4.2.9 සංචිත .. | – 5,915 | 574 | 1,215 | – 236 | 124 | 119 |
| **5. රුපියල් අගය පිළිබඳ ගැලපිලි** .. | **– 39** | **+ 1,491** | **+ 1,371** | — | — | — |
| **6. වැරදීම් හා අත්හැරීම්** .. | **– 254** | **– 206** | **– 1,931** | **– 13** | **– 29** | **– 19** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.

# විදේශ වත්කම්

ත්‍රෛමාසිකව



මහ කොළඹ ආර්ථික කොමිසමට අයත් ව්‍යවසායයන්හි ආයෝජනයන්ගේ වැඩි වීමක සහ අනෙකුත් ව්‍යවසායයන්හි ආයෝජනයන්ගේ අඩු වීමක ඒකාබද්ධ ප්‍රතිඵලයක් ලෙස 1986 දී සෘජු ආයෝජන සඳහා පෞද්ගලික අංශයේ ප්‍රාග්ධන ගලා ඒම්හි සුළු වැඩි වීමක් පෙන්නුම් කෙරිණ. මහ කොළඹ ආර්ථික කොමිසම යටතේ වූ ව්‍යවසායයන්හි සෘජු ආයෝජන 1985 දී විගැහි දශ ලක්ෂ 6.4 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 11.6 දක්වා ඉහළ නැගුනු අතර, මහ කොළඹ ආර්ථික කොමිසමෙන් පිටස්තර වූ ආයෝජන විගැහි දශ ලක්ෂ 18.1 සිට විගැහි දශ ලක්ෂ 13.5 දක්වා අඩු විය. දිගු කාලීන ණය වශයෙන් වූ පෞද්ගලික අංශයේ ශුද්ධ ප්‍රාග්ධන ලැබීම්, අළුතින් ලබාගත් ණය ප්‍රමාණයේ අඩුවීමක් නිසා සියයට 1.3 කින් පහල ගියේය. ලබාගන්නා ලද දළ ණය ප්‍රමාණය 1985 දී විගැහි දශ ලක්ෂ 88 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 83 දක්වා අඩු විය. ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ප්‍රතිග්‍රහණ ණය උපයෝගී කර ගැනීම සැහෙන දුරට අඩු කිරීම හේතුවෙන් පෞද්ගලික අංශයට ලැබුනු ශුද්ධ කෙටි කාලීන ප්‍රාග්ධන ප්‍රමාණය අඩු විය.

රාජ්‍ය අංශයට ලැබුණු දළ මූල්‍ය නොවන ප්‍රාග්ධන ප්‍රමාණය (නිල ප්‍රාග්ධන) 1985 දී විගැහි දශ ලක්ෂ 342 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 346 දක්වා සුළු වශයෙන් වැඩි විණි. 1985 දී විගැහි දශ ලක්ෂ 295 ක් වූ ලබා ගත් දළ යෝජනා ක්‍රම ණය ප්‍රමාණය, 1986 දී විගැහි දශ ලක්ෂ 291ක් විය. කෙසේ වුවද, ලබා ගත් භාණ්ඩ ණය ප්‍රමාණය 1985 දී විගැහි දශ ලක්ෂ 47 සිට 1986 දී විගැහි දශ ලක්ෂ 55 දක්වා සියයට 17 කින් වැඩි විය. ජංගම ගිණුමේ හිඟය පියැවීම සඳහා යෙදවිය හැකි, රාජ්‍ය අංශයේ ප්‍රාග්ධන ලැබීම් වශයෙන් ලද, ශුද්ධ සම්පත් ප්‍රමාණය අඩු කරමින්, 1986 දී රජයේ ණය ආපසු ගෙවීම් ඉකුත් වසරට වඩා සියයට 37.1 කින් වැඩි වී විගැහි දශ ලක්ෂ 99 ක් විය.

**විදේශ වත්කම්**

1985 දී සියයට 17 කින් පහත වැටුණු දළ විදේශ වත්කම් ප්‍රමාණය 1986 දී සියයට 19 කින් තවදුරටත් අඩු විය. පසුගිය වසර අවසානයේදී රුපියල් දශ ලක්ෂ 18,367 (විගැහි දශ ලක්ෂ 611) ක්ව පැවති දළ විදේශ වත්කම් ප්‍රමාණය 1986 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 17,152 (විගැහි දශ ලක්ෂ 492) ක් විය.


රජයේ සහ මහ බැංකුවේ වත්කම්වලින් සමන්විත දළ නිළ සංචිතයන් සියයට 29.5 ක අඩු වීමක් වාර්තා කරමින් 1986 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 10,349 (විගැහි දශ ලක්ෂ 297) ක්ව පැවතුණි. මහ බැංකුවේ විදේශ ද්‍රවශීල වත්කම්වල සහ රජයේ ආයෝජනයන්හි අඩු වීමක් දක්නට ලැබුණි. මේ අතර වෙළෙඳ බැංකු වෙතැති දළ විදේශීය වත්කම් රුපියල් දශ ලක්ෂ 1,077 (විගැහි දශ ලක්ෂ 5) ක වැඩි වීමක් වාර්තා කරමින් වර්ෂය අවසානයේදී රුපියල් දශ ලක්ෂ 6,803 (විගැහි දශ ලක්ෂ 195) ක් විය. 1986 අවසානයේදී පැවති දළ විදේශීය වත්කම් ප්‍රමාණය 1987 වර්ෂය සඳහා ඉලක්ක කර ඇති ආනයන වියදමෙන් මාස 3-4 ක ප්‍රමාණයක් පියැවීම සඳහා සැහිණ.

**විනිමය අනුපාතික වෙනස්වීම්**

1986 තුළදී ඉන්දියානු රුපියල හැර අනෙකුත් සියලුම ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ගවලට ප්‍රතිමුඛව ශ්‍රී ලංකා රුපියලේ අගය පිරිහිනි. ඩොයිෂ් මාර්කයට මෙන්ම ජපන් යෙන්වලට ප්‍රතිමුඛවද රුපියලේ අගය සියයට 24 කින් අඩු විය. එය ප්‍රංශ ප්‍රෑන්ක්වලට ප්‍රතිමුඛව සියයට 18.4 කින්ද, එක්සත් රාජධානි පවුමට ප්‍රතිමුඛව සියයට 5.3 කින්ද අඩු විය. ඇමෙරිකානු ඩොලරයට ප්‍රතිමුඛව සියයට 3.9 කින් පහත වැටුණු අතර, විගැහි වලට ප්‍රතිමුඛව සියයට 13.7 කින් අඩුවිය. කෙසේ වුවද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව 1986 දී රුපියලේ අගය සියයට 4.3 කින් වැඩි විය.

# නාමික විනිමය අනුපාතික*

1978=100





ශ්‍රී ලංකා මහ බැංකුව.

* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

# සඵල විනිමය අනුපාතික*

1978 = 100




ශ්‍රී ලංකා මහ බැංකුව.

* දර්ශකයේ පහත වැටීම අගය අඩුවීම පෙන්නුම් කරයි.

1977 නොවැම්බර් 16 වැනි දින සිට ඇති වූ සමුච්චිත වෙනස්වීම් අනුව රුපියලේ අගය එ. ජ. ඩොලරයට ප්‍රතිමුඛව සියයට 43.9 කින්ද, එක්සත් රාජධානි පවුමට ප්‍රතිමුඛව සියයට 30.5 කින්ද, ඩොයිෂ් මාර්කයට ප්‍රතිමුඛව සියයට 51.6 කින්ද, ප්‍රංශ ප්‍රැන්ක්වලට ප්‍රතිමුඛව සියයට 25.9 කින්ද, ජපන් යෙන්වලට ප්‍රතිමුඛව සියයට 63.6 කින්ද, ඉන්දියානු රුපියලට ප්‍රතිමුඛව සියයට 14.5 කින්ද, අඩු විය. මෙසේ ලෝකයේ ප්‍රධාන ව්‍යවහාර මුදල් වර්ග අතුරින් රුපියලේ අගය වැඩිම ප්‍රමාණයකින් පිරිහුනේ ජපන් යෙන්වලට ප්‍රතිමුඛවය. 1977 නොවැම්බර් 16 සිට 1986 අවසානය දක්වා විගැහි වලට ප්‍රතිමුඛව රුපියලේ අගය අඩුවීම සියයට 45.7 ක් විය.

**1 . 37 සංඛ්‍යා සටහන**

**1984 – 1986 විනිමය අනුපාතික වෙනස්වීම්**

| මුදල් වර්ගය | වර්ෂය අවසානයේ විනිමය අනුපාතික (එකක් රුපියල්) | | | පෙර වර්ෂයට වඩා ප්‍රතිශතය වෙනස්වීම (අ) | |
|---|---|---|---|---|---|
| | 1984 | 1985 | 1986 | 1985 | 1986 |
| විශේෂ ගැණුම් හිමිකම් .. | 25·8065 | 30·0339 | 34·7998 | – 14·07 | – 13·69 |
| ඇ. එ. ජ. ඩොලර් .. | 26·2800 | 27·4075 | 28·5200 | – 4·11 | – 3·9 |
| එ. රා. ස්ටර්ලිං පවුම් .. | 30·5111 | 39·5764 | 41·7961 | – 22·90 | – 5·3 |
| ඩොයිෂ් මාර්ක් .. | 8·3495 | 11·1074 | 14·6727 | – 24·83 | – 24·29 |
| ජපන් යෙන් .. | 0·10497 | 0·136017 | 0·179371 | – 22·82 | – 24·17 |
| ප්‍රංශ ප්‍රැන්ක් .. | 2·7276 | 3·6167 | 4·4337 | – 24·58 | – 18·42 |
| ඉන්දියානු රුපියල් .. | 2·1192 | 2·2575 | 2·1645 | – 6·13 | + 4·3 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) වෙනස්වීම් ගණන් බලා ඇත්තේ ශ්‍රී ලංකා රුපියලට අදල විදේශ ව්‍යවහාර මුදල් වටිනාකම පදනම් කරගෙනය.

ප්‍රධාන වෙළෙඳ හවුල්කරුවන් සමඟ වෙළෙඳ බර තැබීම් මත පිළියෙල වූ නාමික විනිමය අනුපාතික ලෙස විග්‍රහ කෙරෙන ශ්‍රී ලංකාවේ සඵල නාමික විනිමය අනුපාතිකය, ගෙවුම් තුලනයේ වූ දුර්වල තත්ත්වය පිළිබිඹු කරමින් සියයට 12.6 කින් පහත වැටිණි. ශ්‍රී ලංකාව හා මෙම වෙළෙඳ හවුල්කරුවන් අතර උද්ධමන වෙනස්කම් සඳහා ගලපා ගත් පසු ලැබෙන සඵල මූර්ත විනිමය අනුපාතිකය 1986 දී සියයට 10.5 කින් පිරිහුණි. කාර්තුගත සාමාන්‍ය සඵල නාමික විනිමය අනුපාතිකය 1985 හා 1986 සිව් වැනි කාර්තු අතර සියයට 12.6 කින් අඩු විය. එම කාලය තුළදී සඵල මූර්ත විනිමය අනුපාතිකයද සියයට 9.0 කින් අඩු විය.

**විදේශ ණය**

කෙටි කාලීන ණය හා වෙළෙඳ ණය ගැනීම් ඇතුළු නොපියවා ඉතිරිව තිබූ මුළු විදේශ ණය ප්‍රමාණය 1985 අවසානයේදී රුපියල් දශ ලක්ෂ 94,303 (විගැහි දශ ලක්ෂ 3,162) සිට 1986 අවසානය වනවිට රුපියල් දශ ලක්ෂ 113,308 (විගැහි දශ ලක්ෂ 3,262) ක් දක්වා වැඩි විය. 1985 දී වූ සියයට 4.0 ක වැඩි වීම හා සසඳන කළ 1986 දී ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණයේ සියයට 2 ක වැඩි වීමක් (විගැහි වටිනාකම අනුව) පෙන්නුම් කරයි. ගෙවීමට ඇති ණය ප්‍රමාණය දළ දේශීය නිෂ්පාදිතයේ අනුපාතිකයක් ලෙස ගත් කළ සියයට 53.8 සිට සියයට 59.8 දක්වා වැඩි විය.

රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයන්හි මුළු දිගු කාලීන සහ මැදි කාලීන ණය ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 80,745 (විගැහි දශ ලක්ෂ 2,682) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 100,058 (විගැහි දශ ලක්ෂ 2,868) දක්වා වැඩි විය. පසුගිය අවුරුද්දේ ගෙවීමට තිබූ මුළු ණය ප්‍රමාණයෙන් සියයට 84.8 ක මට්ටමක පැවති දිගු හා කෙටි කාලීන ණය ප්‍රමාණය 1986 දී එයින් සියයට 87.9 ක් විය.

## 1 . 38 සංඛ්‍යා සටහන

### 1985 – 1986 (ආ) නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය (බෙදහරිනලද)

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | විගැහි දශ ලක්ෂ | |
|---|---|---|---|---|
| | 1985(අ) | 1986(ආ) | 1985(අ) | 1986(ආ) |
| **1. දිගු හා මධ්‍යකාලීන** .. | **80,744·7** | **100,058·2** | **2,682·1** | **2,868·2** |
| 1. රජය .. | 68,315·3 | 86,871·0 | 2,269·2 | 2,490·2 |
| 2. රජය ඇප වූ රාජ්‍ය සංස්ථා .. | 9,211·4 | 8,194·2 | 305.9 | 234.9 |
| 3. රජය ඇප වූ පෞද්ගලික අංශය .. | 419·3 | 2,240·2 | 14.0 | 64·2 |
| 4. රජය ඇප නොවූ රාජ්‍ය සංස්ථා .. | — | — | — | — |
| 5. රජය ඇප නොවූ පෞද්ගලික අංශය .. | 2,798·7 | 2,752.8 | 93·0 | 78·9 |
| **2. කෙටිකාලීන සහ වෙනත්** .. | **13,558·6** | **13,249·7** | **480·0** | **393·8** |
| 1. ජා. මූ. අ. කළ ගැනීම් .. | 7,913·5 | 7,671·5 | 292·5 | 234·0 |
| 2. බැංකු ණය .. | 6.0 | — | 0.2 | — |
| 3. වෙනත් (ඇ) .. | 5,639·1 | 5,578·2 | 187·3 | 159·9 |
| **3. නොගෙවා ඉතිරිව ඇති ණය එකතුව(1+11)** | **94,303·3** | **113,307·9** | **3,162·1** | **3,262.1** |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

(අ) සංශෝධිත

(ආ) තාවකාලික

(ඇ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ ප්‍රතිග්‍රහන ණය, වෙළඳ ණය සහ ම. කො. අ. කොමිෂම යටතේ ඇති ව්‍යවසායයන් විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකකයන්ගෙන් ලබාගත් ණයද ඇතුළත් වේ.

විශේෂයෙන් රජය විසින් දිගු කාලීන හා මැදි කාලීන ණය වැඩිපුර ලබා ගැනීම විදේශ ණයෙහි වර්ධනයට මූලික හේතුව විය. ගෙවීමට ඇති මුළු විදේශ ණය ප්‍රමාණයෙන් වැඩි කොටසක් නියෝජනය කරන රජයේ දිගු කාලීන හා මැදි කාලීන ණය ප්‍රමාණය 1985 දී රුපියල් දශ ලක්ෂ 68,315 (විගැහි දශ ලක්ෂ 2,269) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 86,871 (විගැහි දශ ලක්ෂ 2,490) දක්වා වැඩි විය. මෙයින්, රජයේ දිගු කාලීන හා මැදි කාලීන ණයවලින් අඩකටත් වැඩි වූ රජයේ ද්විපාර්ශවීය ණය රුපියල් දශ ලක්ෂ 40,075 (විගැහි දශ ලක්ෂ 1,331) සිට රුපියල් දශ ලක්ෂ 53,323 (විගැහි දශ ලක්ෂ 1,529) දක්වා වැඩි විය. රජයේ බහු පාර්ශවීය ණය 1986 අවසානය වන විට රුපියල් දශ ලක්ෂ 23,983 (විගැහි දශ ලක්ෂ 688) හි මට්ටම දක්වා රුපියල් දශ ලක්ෂ 4,470 (විගැහි දශ ලක්ෂ 39) කින් වැඩි විය.

ගෙවීමට ඇති වෙළෙඳ ණය ප්‍රමාණය, වර්ෂය තුළදී විගැහි දශ ලක්ෂ 13 කින් අඩුවීම සැළකිය යුතු කරුණකි. රජය විසින් ප්‍රයෝජනයට ගන්නා ලද සැපයුම්කරුවන්ගේ ණය ප්‍රමාණයෙහි ශුද්ධ අඩු වීමක් පෙන්නුම් කෙරිණි. රාජ්‍ය අංශයේ ගෙවීමට ඉතිරිව ඇති ණය ප්‍රමාණයෙන් යෝජනා ක්‍රම ණය සහ යෝජනා ක්‍රම නොවන (භාණ්ඩ) ණය ප්‍රමාණය පිළිවෙලින් සියයට 58.4 ක් සහ සියයට 39.2 ක් විය.

රජයේ සංස්ථාවල නොපියවන ලද දිගු හා මැදි කාලීන ණය 1985 දී රුපියල් දශ ලක්ෂ 9,211 (විගැහි දශ ලක්ෂ 306) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 8,194 (විගැහි දශ ලක්ෂ 235) දක්වා අඩු විය. විගැහි වටිනාකම අනුව මෙම අඩු වීම සියයට 23.2 කි. රජය ඇප නොවූ පෞද්ගලික අංශයේ ණය සුළු වශයෙන් අඩු වූ අතර, රජය ඇප වූ ණය රුපියල් දශ ලක්ෂ 1,826 (විගැහි දශ ලක්ෂ 50) කින් වැඩි විය.

## 1.39 සංඛ්‍යා සටහන

## 1982 – 1986 නොගෙවා ඉතිරිව ඇති විදේශ ණය

| වර්ගය | රුපියල් දශ ලක්ෂ | | | | | ඩොලර් දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1986(ආ) | 1982(අ) | 1983(අ) | 1984(අ) | 1985(අ) | 1986(ආ) |
| 1. දිගුකාලීන ණය (ඇ) එයින් .. | 34,597·3 | 46,025·0 | 53,680·9 | 67,792·2 | 86,355·8 | 1,471·1 | 1,758·4 | 2,083·9 | 2,251·8 | 2,475·4 |
| 1·1 යෝජනා ක්‍රම ණය .. | 12,451·8 | 19,531·0 | 25,971·0 | 36,406·0 | 50,417·9 | 529·5 | 746·2 | 1,008·2 | 1,209·3 | 1,445·2 |
| 1·2 යෝජනා ක්‍රම නොවන ණය .. | 19,545·5 | 23,490·3 | 24,805·2 | 28,802·3 | 33,876·9 | 831·1 | 897·5 | 962·9 | 956·7 | 971·1 |
| 1·3 ජා.මු.අ. භාරකාරත්ව අරමුදල් ණය .. | 2,600·0 | 3,003·7 | 2,904·7 | 2,583·9 | 2,061·0 | 110·5 | 114·7 | 112·8 | 85·8 | 59·1 |
| 2. සැපයුම් කරුවන්ගේ ණය .. | 996·6 | 889·4 | 588·6 | 561·8 | 529·0 | 42·4 | 34·0 | 22·8 | 18·7 | 15·2 |
| 3. ජා.මු.අ. භාවිත ණය .. | 7,977·0 | 8,225·4 | 8,643·6 | 7,913·5 | 7,671·5 | 341·5 | 331·1 | 328·3 | 292·5 | 234·0 |
| 4. බැංකු ණය ගැනීම් .. | 1,824·1 | 1,853·7 | 3·3 | 6·0 | — | 77·6 | 70·8 | 0·1 | 0·2 | — |
| 5. වෙනත් (ඈ) .. | 10,766·9 | 15,185·5 | 15,496·6 | 18,029·8 | 18,751·6 | 457·8 | 580·2 | 601·6 | 598·9 | 537·5 |
| එකතුව .. | 56,161·9 | 72,179·0 | 78,413·0 | 94,303·3 | 113,307·9 | 2,390·4 | 2,774·5 | 3,036·7 | 3,162·1 | 3,262·1 |

(අ) සංශෝධිත.
(ආ) තාවකාලික.
(ඇ) සැපයුම් කරුවන්ගේ ණය අත්හැරීමෙන් පසු රජයේ ණය.
(ඈ) රාජ්‍ය සංස්ථාවල හා එයාර් ලංකා සමාගමේ වෙළෙඳ ණය, ම. කො. අ. කොමිසම යටතේ ඇති සහ අනෙකුත් අනුමත ව්‍යවසායන්, විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් ගත් ණය, පෞද්ගලික විදේශීය ණය ගැනීම් සහ වෙළෙඳ ණය වලින් සමන්විතය.

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව.

## 1 . 40 සංඛ්‍යා සටහන
## 1982 – 1986 ණය සේවා ගෙවීම්

| ශීර්ෂය | රුපියල් දශ ලක්ෂ | | | | | විගැහි දශ ලක්ෂ | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 1982 | 1983 | 1984 | 1985 | 1986(අ) | 1982 | 1983 | 1984 | 1985 | 1986(අ) |
| 1. ණය සේවා ගෙවීම් .. | 5,216·6 | 7,135·8 | 8,026·1 | 9,361·8 | 11,643·5 | 227·5 | 287·1 | 308·0 | 340·6 | 356·4 |
| 1·1 ණය ආපසු ගෙවීම් .. | 2,563·3 | 3,120·7 | 3,437·7 | 4,533·2 | 6,837·1 | 112·0 | 126·5 | 132·3 | 165·5 | 210·3 |
| (i) ජා. මූ. අරමුදලට .. | 1,146·3 | 1,097·3 | 593·3 | 967·4 | 1,861·0 | 49·9 | 46·2 | 22·7 | 35·8 | 58·6 |
| (ii) අනෙකුත් (ආ) .. | 1,417·0 | 2,023·4 | 2.844·4 | 3,565·8 | 4,976·1 | 62·1 | 80·3 | 109·6 | 129·7 | 151·7 |
| 1·2 පොළී ගෙවීම් .. | 2,653·3 | 4,015·1 | 4,588·4 | 4,828·6 | 4,806·4 | 115·5 | 160·6 | 175·7 | 175·1 | 146·1 |
| (i) ජා. මූ. අරමුදලට .. | 519·5 | 749·3 | 819·2 | 745·6 | 693·0 | 22·4 | 30·8 | 31·4 | 27·1 | 21·2 |
| (ii) අනෙකුත් .. | 2,133·8 | 3,265·8 | 3,769·2 | 4,083·0 | 4,113·4 | 93·1 | 129·8 | 144·3 | 148·0 | 124·9 |
| 2. භාණ්ඩ අපනයන හා සේවාවන්ගෙන් ඉපැයීම් .. | 28,059·8 | 33,071·6 | 45,764·9 | 44,654·9 | 44,474·3 | 1,221·7 | 1,312·9 | 1,756·1 | 1,619·0 | 1,351·2 |
| 3. භාණ්ඩ අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාමයන්ගෙන් ලැබීම් .. | 34,083·5 | 39,987·2 | 53,418·0 | 52,574·9 | 53,616·6 | 1,484·1 | 1,588·0 | 2,049·6 | 1,906·6 | 1,628·4 |
| 4. ණය සේවා අනුපාතික (ඇ) (2 හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 18·6 | 21·6 | 17·5 | 21·0 | 26·2 | 18·6 | 21·9 | 17·5 | 21·0 | 26·3 |
| (ii) ජා. මූ. අ. ගනුදෙනු හැර .. | 12·7 | 16·0 | 14·4 | 17·1 | 20·4 | 12·7 | 16·0 | 14·5 | 17·2 | 20·5 |
| 5. ණය සේවා අනුපාතික (ඇ) (3 හි ප්‍රතිශතයක් වශයෙන්) | | | | | | | | | | |
| (i) සමස්ත අනුපාතිකය .. | 15·3 | 17·8 | 15·0 | 17·8 | 21·7 | 15·3 | 18·1 | 15·0 | 17·9 | 21·9 |
| (ii) ජා මූ. අ. ගනුදෙනු හැර .. | 10·4 | 13·2 | 12·4 | 14·5 | 17·0 | 10·4 | 13·2 | 12·4 | 14·6 | 17·0 |

(අ) තාවකාලික.

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

(ආ) තොරතුරු ලබාගැනීමට නොහැකිවීම නිසා ම. කො. ආ. කොමිසමේ ව්‍යවසායයන්ට විදේශ ව්‍යවහාර මුදල් බැංකු ඒකක වලින් නිකුත් කළ ණය සහ අනෙකුත් අනුමත ව්‍යවසායයන්ට වි. ව්‍ය. මු. බැ. ඒකක තුලින් නිකුත් කළ සමහරක් ණය වෙනුවෙන් වූ ආපසු ගෙවීම් මීට ඇතුළත් නොවේ.

(ඇ) වර්ෂය තුළ විනිමය අනුපාතිකයන්හි සිදුවූ වෙනස්වීම් හේතුවෙන්, රුපියල් වටිනාකම හා විගැහි වටිනාකම අනුව වෙන් වෙන් වශයෙන් ගණනය කරන ලද ණය සේවා අනුපාතිකයන් වෙනස් වේ.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් අළුතින් ණය ගැනීම් නොතිබුණු හෙයින්, එයට ඇති ශ්‍රී ලංකාවේ ණය බැඳියාව දෙවැනි වසරටත් 1986 දී අඩු විය. අරමුදලේ ණය භාවිතය වෙනුවෙන් වූ ණය ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 7,914 (විගැහි දශ ලක්ෂ 293) සිට රුපියල් දශ ලක්ෂ 7,672 (විගැහි දශ ලක්ෂ 234) දක්වා අඩු විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ගත් ණය අත්හැරීමෙන් පසු කෙටි කාලීන සහ අනෙකුත් ණය, රුපියල් වටිනාකම සහ විගැහි වටිනාකම අනුව රුපියල් දශ ලක්ෂ 67 කින් සහ විගැහි දශ ලක්ෂ 28 කින් අඩු විය.

**ණය සේවා ගෙවීම්**

දිගු හා මැදි කාලීන ණය ආපසු ගෙවීම් සහ සියලුම විදේශ ණය සඳහා වූ පොළී ගෙවීම් වලින් සමන්විත ණය සේවා ගෙවීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 9,362 (විගැහි දශ ලක්ෂ 340) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 11,644 (විගැහි දශ ලක්ෂ 356) දක්වා වැඩි විය.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් කළ ප්‍රති මිළදී ගැනීම් ඇතුළත් ණය ආපසු ගෙවීම් මේ කාලය තුළ රුපියල් දශ ලක්ෂ 4,533 (විගැහි දශ ලක්ෂ 166) සිට රුපියල් දශ ලක්ෂ 6,837 (විගැහි දශ ලක්ෂ 210) දක්වා වැඩි විය. කෙසේ වුවද, පොළී සහ සේවා ගෙවීම් (ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ගණුදෙනු වෙනුවෙන් වූ පොළී සහ සේවා ගෙවීම්ද ඇතුළත්ව) රුපියල් දශ ලක්ෂ 4,829 (විගැහි දශ ලක්ෂ 175) සිට රුපියල් දශ ලක්ෂ 4,806 (විගැහි දශ ලක්ෂ 146) දක්වා අඩු විය. මෙයට හේතුවූයේ ජාත්‍යන්තර වෙළෙඳපොලෙහි පොළී ප්‍රමාණයන් පහත මට්ටමක පැවතීමත්, වර්ෂය තුළදී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් විගැහි සඳහා පොළී අනුපාතය අඩු කිරීමත්ය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය සඳහා වූ ප්‍රති මිළදී ගැනීම් 1986 දී රුපියල් දශ ලක්ෂ 1,861 (විගැහි දශ ලක්ෂ 59) ක් වූ අතර, පසුගිය වසරේදී එය රුපියල් දශ ලක්ෂ 967 (විගැහි දශ ලක්ෂ 36) ක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත පොළී සහ අනෙකුත් සේවා ගෙවීම් 1985 දී රුපියල් දශ ලක්ෂ 746 (විගැහි දශ ලක්ෂ 27) සිට 1986 දී රුපියල් දශ ලක්ෂ 693 (විගැහි දශ ලක්ෂ 21) දක්වා අඩු විය.

මුළු ණය සේවා ගෙවීම්, භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම්වල අනුපාතයක් ලෙස ගත්විට 1985 දී සියයට 21.0 සිට 1986 දී සියයට 26.3 දක්වා වැඩි විය. මෙය, අපනයන ඉපැයීම්වල අඩු වීමක් හා ණය සේවා ගෙවීම්හි වැඩිවීමක ඒකාබද්ධ ප්‍රතිඵලයක් විය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කළ ගණුදෙනු අත්හැර ගණනය කෙරෙන ණය සේවා අනුපාතිකය 1985 දී සියයට 17.2 සිට 1986 දී සියයට 20.5 දක්වා වැඩි විය. ණය සේවා ගෙවීම්, අපනයන, සේවා හා පෞද්ගලික සංක්‍රාම යන අංශවලින් ලත් ඉපැයීම්වල ප්‍රතිශතයක් ලෙස දක්වන කළ සමස්ථ ණය සේවා අනුපාතිකය 1985 දී සියයට 17.9 සිට 1986 දී සියයට 21.9 දක්වා වැඩි විය.